රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 32/2019

මගේ අංකය: EST-3/POLIC/04/0058
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.10.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් වන**
**ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 3:7 උප වගන්තිය සංශෝධනය කිරීම**

ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 3:7 උප වගන්තියට පහත පරිදි 3:7:1 ලෙස නව උප වගන්තියක් ඇතුළත් කරමින් දේශපාලන අයිතිවාසිකම් හිමි ක්ෂේත්‍ර නිලධරයන්ගේ සේවා ස්ථානය හා ස්ථාන මාරුවීම් සම්බන්ධ විධිවිධාන සංශෝධනය කිරීමට 2019.10.01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

3:7:1 එතකුදු වුවත් එම නිලධරයා ක්ෂේත්‍ර නිලධරයකු වන කල්හි තමන් ඡන්දය ඉල්ලා සිටි පළාත් පාලන ආයතන බල ප්‍රදේශයෙන් බැහැර සේවා ස්ථානයක සේවයේ නියුතුව සිට පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තේරී පත් වුවහොත් තමන් ඡන්දය ඉල්ලා සිටි පළාත් පාලන බල ප්‍රදේශය තුළ පිහිටි සේවා ස්ථානයකට ඔහු අනුයුක්ත නොකළ යුතුය. නිලධරයාගේ ඉල්ලීම පරිදි ඔහුට එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයෙන් බැහැර ආසන්න සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ලබා ගැනීමට ඉඩදිය යුතුය.

02. මෙම විධිවිධාන 2019.10.01 දින සිට බලාත්මක වේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය